**ශීර්ෂය 287 - ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015**

---

ශීර්ෂ 287 - ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 අගෝස්තු 03 දින දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කල හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම.**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1. විසර්ජන ගිණුම**

---

**මුළු ප්‍රතිපාදන හා වියදම**

---

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 400.30 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 388.99 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 11.31 ක් හෙවත් සියයට 2.83 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 377.80 | 369.87 | 7.93 | 2.10 |
| මූලධන | 22.50 | 19.12 | 3.38 | 15.02 |
| **එකතුව** | **400.30** | **388.99** | **11.31** | **2.83** |

## 2.2. රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

### පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

දෙපාර්තමේන්තුවට අදා ළ විෂය අංක 28701 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂයන් | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 22.17 | 18.72 | 11.17 | 14.95 | 65.00 | 40.36 |

## 2.3. අග්‍රිම ගිණුම

දෙපාර්තමේන්තුව යටතේ වූ අංක 7002/0000/00/0124/0015/000 දරන අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.මිලියන 0.007 ක් විය.

## 2.4. පොදු තැන්පත් ගිණුම

දෙපාර්තමේන්තුව යටතේ වන තැන්පත් ගිණුම් 3 ක 2015 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු. මිලියන 0.25 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | **2015 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | රු. මිලියන |
| 6000/0000/00/0013/0087/000 | 0.02 |
| 6000/0000/00/0016/0080/000 | 0.08 |
| 6000/0000/00/0018/0083/000 | 0.15 |
| **එකතුව** | **0.25** |

## 2.5. විගණන නිරීක්ෂණය

ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | **ලේඛන වර්ගය** | **අදාළ රෙගුලාසිය** |
|---|---|---|
| (i) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/021 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ii) | වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය | මුදල් රෙගුලාසි 1647 (ඉ) |

**3.2 විසර්ජන ගිණුම.**

**-----------------**

**අයවැය විචලනය**

**-------------------**

වැය විෂයයන් 14 ක් සඳහා අධිප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයයන්ගේ ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසුව ඉතිරිය සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 10 ක සිට සියයට 59 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

**3.3 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබද සැසදුම් ප්‍රකාශය**

**-------------------------------------------------------------------**

විෂය අංක 28701 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසදුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.1,218,872 ක් වූ අතර, එම හිගහිටි ශේෂ වර්ෂ 1 ක සිට වර්ෂ 8 දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

**3.4. අභ්‍යන්තර විගණනය**

**----------------------**

දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

**3.5. වත්කම් කළමනාකරණය**

**--------------------------**

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

**---------------------------------------**

දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව අයිතම් වර්ග 15 ක අතිරික්ත හා අයිතම් වර්ග 36 ක ඌනතාවන් නිරීක්ෂණය විය. මෙම ඌනතාවයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 103 ප්‍රකාරව කටයුතු කිරීමටත්, අතිරික්තතා සම්බන්ධයෙන් උචිත ක්‍රියාමාර්ගයන් ගැනීමටත් කටයුතු කර නොතිබුණි.

**3.6. කාර්යසාධනය**

**----------------**

දෙපාර්තමේන්තුවේ කාරයසාධනය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවන්වලදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) දෙපාර්තමේන්තුවේ කාර්යයන්හි ප්‍රගතිය**

**-------------------------------------------**

ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ කාර්යයන්හි ප්‍රගතිය පහත දැක්වේ.

**ඉඩම් අංශය**

**------------**

| | **ඉලක්කය** | **ප්‍රගතිය** | **කාර්යයන් ඉටු කිරීමේ ප්‍රතිශතය** |
|---|---|---|---|
| | ----------- | --------- | ------------------ |
| ඉඩම් නිරවුල් කිරීමේ දැන්වීම් ප්‍රසිද්ධ කිරීම | 57 | - | 0 |
| ඉඩම් නිරවුල් කිරීමේ ආඥාව සඳහා විධාන සකස් කිරීම. | 32 | 06 | 19 |
| මැනුම්පති වෙත මැනුම් කිරීම සඳහා යැවීම | 02 | 08 | 400 |
| නිරවුල් කිරීමේ ආඥාව ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත යැවීම. | 07 | 06 | 86 |
| නිරවුල් කිරීමේ ආඥාව අමාත්‍යාංශ අනුමැතියට යැවීම. | 06 | 11 | 183 |
| නිරවුල් කිරීමේ ආඥා ගැසට් පත්‍රයේ පල කිරීම | 10 | 13 | 130 |
| ගම් නිදහස් කිරීම | 20 | 23 | 115 |

ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පනත යටතේ ගම් නිදහස් කිරීමේ කාර්යයට අදාළව 2015 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබූ ඉලක්කයන්ගෙන් ඉඩම් නිරවුල් කිරීමේ දැන්වීම් ප්‍රසිද්ධ කිරීම අවසන් කර නොතිබුණි. ඉලක්ක සකස් කිරීමේදී පසුගිය වර්ෂයෙන් ඉදිරියට එන පියවරයන් පිළිබඳව සැලැකිලිමත් නොවීම හේතුවෙන් ඉලක්කයට සාපේක්ෂව ප්‍රගතිය ඉහළ මට්ටමක පවතින බව නිරූපනය වී තිබුණි.

(ආ) **ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ කාර්යයන්**

**--------------------------------------------**

**බිම්සවිය**

**---------**

බිම්සවිය වැඩ සටහනෙහි සමාලෝචිත වර්ෂයේදී සැලැසුම් කරන ලද ඉලක්කයන් කරා ලගා වීම අඩු මට්ටමකින් පැවැතුණි. විස්තර පහත දැක්වේ.

| | **ඉලක්කය** | **ප්‍රගතිය** | **කාර්යයන් ඉටු කිරීමේ ප්‍රතිශතය** |
|---|---|---|---|
| | ---------- | -------- | ------------------ |
| ක්ෂේත්‍ර විමර්ශන සංඛ්‍යාව | 204,930 | 104,163 | 50 |
| ඉඩම් රෙජිස්ට්‍රාර් පරීක්ෂණ සංඛ්‍යාව | 135,000 | 56,758 | 42 |
| ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව නිර්දේශ කර අනුමත කළ සංඛ්‍යාව | 125,810 | 51,475 | 41 |
| ගැසට් කල ඉඩම් කැබලි සංඛ්‍යාව | 125,000 | 53,484 | 43 |
| ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත යවා ඇති ඉඩම් කැබලි සංඛ්‍යාව | 124,000 | 53,584 | 43 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) බිම්සවිය වැඩසටහන යටතේ ඉටු කළ යුතු සියලුම කාර්යයන්හි ප්‍රගතිය සියයට 50 කට වඩා අඩු මට්ටමක පැවැති අතර දෙපාර්තමේන්තුවේ ප්‍රධානතම කාර්යයක් වූ හිමිකම් ලියාපදිංචි කිරීමේ කාර්යයෙහි ප්‍රගතිය පහළ මට්ටමක පැවතුණි.

(ii) 2015 වර්ෂයට අදාළව ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබූ බිම්සවිය වැඩසටහනට අදාළ ඉලක්කයන් 2016 අප්‍රේල් මාසයේදී සංශෝධනය කර තිබුණි. එය තාත්ත්වික නොවන බව විගණනයේදී අනාවරණය විය.

**(ඇ) ඉටු නොකළ කාර්යයන්**

ඉඩම් නිරවුල් කිරීමට අදාළ පැරණි සහ වටිනා ලේඛන සංරක්ෂණය කිරීම සඳහා කාර්යක්ෂම ලේඛන සංරක්ෂණ පද්ධතියක් පවත්වාගෙන යාමේ කාර්ය ඉටු කිරීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි.

## 3.7 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 107 | 49 | 58 | - |
| (ii) | තෘතියික මට්ටම | 06 | 06 | 01 | 01 |
| (iii) | ද්විතියික මට්ටම | 1,747 | 633 | 1,114 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 254 | 151 | 103 | - |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 126 | - | 126 | - |
| | **එකතුව** | **2,240** | **839** | **1,402** | **01** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) උප කාර්යාල 90 කට කාර්ය මණ්ඩලය අනුමත කරගෙන තිබුණද, කාර්යාල 46 ක් පමණක් පිහිටුවා තිබීම නිසා කාර්ය මණ්ඩල පුරප්පාඩු සංඛ්‍යාව බෙහෙවින් වැඩි වී තිබුණි.

(ආ) තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ සහකාර තනතුරු 186 ක් අනුමත කර තිබුණු නමුත් තථ්‍ය කාර්ය මණ්ඩලය 6 ක් පමණ විය. තිබෙන උප කාර්යාල සංඛ්‍යාව හා සසඳන විට ප්‍රමාණවත් නොවන කාර්ය මණ්ඩලයක් තථ්‍ය වශයෙන් සිටින බැවින් මෙම කාර්ය මණ්ඩලය ඇත්ත වශයෙන්ම අවශ්‍යද යන්න සහ එසේ නැතහොත් අවශ්‍ය කාර්ය මණ්ඩලය රහිතව කාර්යය ඉටුකිරීම කෙසේ සිදුවේද යන්න පිළිබඳ ගැටළු සහගත විය.

(ඇ) ලේඛන සංරක්ෂක තනතුරු 91 ක් අනුමත කර තිබුණද, එක් අයෙකු පමණක් සිටින අතර, කාර්යාල කාර්ය සහයක (කොන්ත්‍රාත් පදනමින්) 126 ක් අනුමත කරවා ගැනීමේදී උපකාර්යාල 90 ක් යන පදනමින් සිදු කර ගෙන තිබුණද, එම උප කාර්යාල සංඛ්‍යාව ආරම්භ නොකිරීම මත මෙසේ පුරප්පාඩු සිදු වී තිබුණු බව අනාවරණය විය.

(ඈ) මේ අනුව දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය සම්බන්ධයෙන් කාර්ය මණ්ඩලය පුරප්පාඩුව පැවතීම කොතෙක් දුරට බලපාන්නේද යන්න පිළිබඳව ඇගයීමක් සිදු කර, පවතින උප කාර්යාල ගණනට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු බවට විගණනයේදී නිරීක්ෂණය විය.